ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2125/3 – 2019 මැයි 27 වැනි සඳුදා – 2019.05.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2017/09.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණු පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ජී. දයා හේමන්ත සිල්වා මයා, "හේමන්ත", ගාලු පාර, කුඩා වස්කඩුව, වස්කඩුව.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

සීමාසහිත ලංකා සළුසල, අංක 93, ජාවත්ත පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, රත්මලාන, සිරිමල් උයන, අරලිය මාවත, අංක 03, ආර්. එස්. ආරියප්පෙරුම මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

රවීන්ද්‍ර සමරවීර,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 මැයි මස 23 වැනි දින,
කොළඹ දී ය.

1A – G 30157 – 11 (2019/05)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/04/2017/09.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ජී. දයා හේමන්ත සිල්වා මයා, "හේමන්ත", ගාලු පාර, කුඩා වස්කඩුව, වස්කඩුව.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

සීමාසහිත ලංකා සළුසල, අංක 93, ජාවත්ත පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''සීමාසහිත ලංකා සළුසල ආයතනයේ ජ්‍යෙෂ්ඨ පරිපාලන කළමනාකරු ලෙස සේවය කළ ජී. දයා හේමන්ත සිල්වා මහතා ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ වන්දි ක්‍රමය යටතේ විශ්‍රාම ගැන්වීමේ දී ඔහුට ගෙවූ වන්දි හා පාරිතෝෂික මුදලින් රුපියල් දෙලක්ෂ දහනවදහස් එකසිය තිස්හතයි ශත අනූව (රු. 2,19,137.90) ක මුදලක් අඩුකර ගැනීම යුක්ති සහගත ද එසේ නොවේ නම් ඔහුට හිමිවිය යුතු සහනය කුමක්ද ? යන්න පිළිබඳව වේ''.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 මැයි මස 10 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

06 - 177

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.